රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ :- 08/2005(III)

මගේ අංකය:- ආ/7/3/1/31
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.
2005. අගෝස්තු මස 23 දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 11 වගන්තිය සංශෝධනය කිරීම**

දේපල ණය මුදල බැංකු මගින් ලබාදීමට අදාල නව විධිවිධාන ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 11 වගන්තියට ආදේශ කරමින් 2005.03.31 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 08/2005 පහත දක්වෙන වගන්ති එකතු කරමින් සංශෝධනය කෙරේ.

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 08/2005 ට සංශෝධන වශයෙන් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 08/2005 (I) හා 08/2005 (II) අවලංගු කරන අතර එම විධිවිධාන මෙම චක්‍රලේඛයට එකතු කරනු ලැබේ. ආයතන සංග්‍රහයේ 26 පරිශිෂ්ටය හා 28 පරිශිෂ්ටය සංශෝධනය කරනු ලබන අතර 29 පරිශිෂ්ටය හා 30 පරිශිෂ්ටය අලුතින් එකතු කරනු ලැබේ.

11:1 ණය ලබාදිය හැකි කාර්යන්

11:1:6 නිවාසයක් තැනීමට සුදුසු ඉඩමක් මිලදී ගැනීම හා එහි නිවසක් ඉදිකිරීම

11:1:7 ණය ඉල්ලුම්කරුගේ කලත්‍රයාට අයත් ඉඩමක අලුතින් නිවසක් ඉදිකිරීමට / ඉදිකර ඇති නිවසක් වැඩි දියුණු කිරීමට / අලුතින් කොටසක් එකතු කිරීමට / අර්ධ වශයෙන් ඉදිකර ඇති නිවසක ඉතිරි වැඩ නිම කිරීමට

11:1:8 ස්වර්ණභූමි / ජයභූමි දීමනා පත්‍ර යටතේ ලබාදී ඇති ඉඩමක හෝ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව යටතේ ලබාදී ඇති ඉඩමක නිවසක් ඉදිකිරීමට / ඉදිකර ඇති නිවස වැඩි දියුණු කිරීමට / අලුතින් කොටසක් එකතු කිරීම / අර්ධ වශයෙන් ඉදිකර ඇති නිවසක ඉතිරි වැඩ නිම කිරීමට

11:2 සුදුසුකම්

11:2:3 ස්වාමිපුරුෂයා හා භාර්යාව යන දෙදෙනාම රජයේ නිලධාරීන් නම් දෙදෙනාම වෙන් වෙන්ව ණය ලබා ගැනීමට සුදුස්සෝ වෙති.

11:2:3:1 ස්වාමිපුරුෂයා හා භාර්යාව යන දෙදෙනාම රජයේ නිලධාරීන් නම් එක් අයකු විසින් රජයේ නිලධාරීන්ට දේපල ණය ලබාදෙන බැංකුවකින් දැනටමත් ලබා ගත් ණය මුදලින් මිලට ගෙන ඇති ඉඩමේ නිවසක් ඉදිකිරීමට/ඉදිකර ඇති නිවසක් වැඩි දියුණු කිරීමට/ අලුතින් කොටසක් එකතු කිරීමට/අර්ධ වශයෙන් ඉදිකර ඇති නිවසක ඉතිරි වැඩ නිම කිරීමට, ණය ලබා නොගත් නිලධාරියාට එම බැංකුවෙන්ම බද්ධ ගිණුමක් යටතේ ණය ලබාගත හැකිය. එහෙත් පෙර ණය මුදල මෙම චක්‍රලේඛය නිකුත් කරන ලද දිනට පෙර බැංකුවේ සාමාන්‍ය පොලී අනුපාතිකය යටතේ ලබාගෙන ඇත්නම් එම පෙර ලබාගත් ණය මුදල සඳහා රජයේ පොලී වියදම හිමි නොවනු ඇත.

11:2:3:2 ස්වාමිපුරුෂයා හා භාර්යාව යන දෙදෙනාම රජයේ නිලධාරීන් නම් නිවසක් ඉදිකිරීමට/නිවසක් තැනීමට සුදුසු ඉඩමක් මිලට ගැනීමට හා එහි නිවසක් ඉදිකිරීමට/නිවසක් සහිත ඉඩමක්/ මහල් නිවාසයක් මිලට ගැනීමට බද්ධ ගිණුමක් යටතේ දෙදෙනාටම ණය ලබාගත හැකිය.

11:2:5 ණය ඉල්ලුම්කරුගේ කලත්‍රයා රජයේ නිලධාරියකු නොවුවද, කලත්‍රයාට අයත් ඉඩමක නිවස ඉදිකිරීම සඳහා බද්ධ ගිණුමක් යටතේ ණය ලබාගත හැකිය.

11:2:6 මෙම ක්‍රමය යටතේ ණය ලබාගත හැක්කේ සේවා කාලය තුළ එක් වරක් පමණි.

දැනටමත් 11:1 වගන්තියේ සඳහන් කාර්යයන් සඳහා ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය යටතේ දේපල ණය ලබාගෙන ඇති නිලධාරීන්ට මෙම ක්‍රමය යටතේ නැවත ණය ලබා ගැනීමට හිමිකම නැත.

11:4 <u>ණය ප්‍රමාණය</u>

11.4.1 නිලධාරියාට හිමිකම් ලබාගත හැකි උපරිම ණය මුදල නිලධාරියාගේ දීමනා රහිත වසර පහක ඒකාබද්ධ වැටුප හෝ රුපියල් ලක්ෂ 20 ක මුදල යන දෙකෙන් අඩු මුදල වේ.

11:9 <u>ණය ඉල්ලුම්පත් පෙරසැරි කිරීමේ ගාස්තු</u>

නිර්දේශිත බැංකුවකින් ණය ලබාගැනීමට යාමේදී ඉදිරිපත් කළයුතු ලියකියවිලි වන තක්සේරු වාර්තාව, නීතිඥ ගාස්තු හා ගමන් වියදම් වෙනුවෙන් රු. 7500/- ක් හෝ ණය මුදලින් 1% ක් යන දෙකෙන් අඩු මුදල ගෙවිය යුතුය.

11:9:1 ඉහත 11:9 වගන්තියේ සඳහන් නිලධාරියා ගෙවිය යුතු අවම මුදල අනුමත වූ ණය මුදලට එකතු කර මාසිකව අයකරගනු ලබන වාරික මුදලින් අඩුකර ගත යුතුය.

11:9:2 ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්‍රිරු ලබාගැනීම, හිමිකම් වාර්තාව ලබා ගැනීම, මැණුම් සැලසුම් ගාස්තු හා හිමිකම් ඔප්පුවල දෝෂ ඇත්නම් ඒවා රක්ෂණය කිරීම සඳහා යන වියදම් (ඉහත 11:9 වගන්තියේ සඳහන් මුදලට අමතරව) නිලධාරියා විසින් පෞද්ගලිකව දැරිය යුතුය.

11:10 <u>දේපල ණය දීමේ සමාන්‍ය කොන්දේසි</u>

11:10:1:3 බැංකු උපරිම ණය මුදල අනුමත කිරීමේදී නිලධාරියාගේ දීමනා හැර මාසික ශුද්ධ වැටුපෙන් ණය මුදලේ වාරිකය හා නිලධරියාගෙන් අය කරනු ලබන 4% ක පොලිය යන කොටස් දෙකම අඩුකිරීමට හැකිවන ආකාරයට තීරණය කල යුතුවේ.

11:11 <u>ණය ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම හා නිර්දේශ කිරීමේ ක්‍රියාදමය</u>

11:11:1 ණය ඉල්ලුම්කරුවකු විසින් 26 පරිශිෂ්ටය අනුව අයදුම්පත්‍රය පිටපත් 2 කින් පිලියෙල කර ණය ලබාගැනීමට අපේක්ෂිත බැංකුවෙන් නිකුත් කරන ලද සම්පූර්ණ කල ඉල්ලුම්පත්‍රය සමඟ 29 පරිශිෂ්ටය අනුව අදාළ ලියකියවිලි සහිතව අමාත්‍යාංශ ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය.

11:11:2 අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව විසින් අදාළ ණය ඉල්ලුම්පත්‍රය ලේඛනයකට ඇතුලත් කර 11:10:1 වගන්තිය අනුව ලබාදිය හැකි ණය මුදල තීරණය කොට ණය ඉල්ලුම්කරුගේ කැමැත්ත ලබාදී ඇති බැංකුව වෙත සතියක් ඇතුලත නිර්දේශිත ණය ඉල්ලුම් පත්‍රය යොමු කිරීමට කටයුතු කළ යුතුය.

11:11:5 අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව විසින් බැංකුවක් වෙත නිර්දේශ කරන ලද ණය ඉල්ලුම්පත්‍රයක් සම්බන්ධයෙන් තවදුරටත් පැහැදිලි කිරීම් බැංකුවට අවශ්‍ය වන අවස්ථාවකදී නිලධාරියා විසින් එම පැහැදිලි කිරීම් බැංකුව වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම පැහැදිලි කිරීම් මාස තුනක් ඇතුලත ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් එවැනි ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. කිසිදු හේතුවකින් මෙම කාලය දීර්ඝ කිරීමක් සිදු නොකරනු ලබන අතර එවැනි ඉල්ලීම් ද නව ඉල්ලීමක් ලෙස පොරොත්තු ලේඛනයට ඇතුලත් කරනු ලැබේ.

**03.** **2005 වර්ෂය තුලදී ඉහත 11:1 වගන්තියේ සඳහන් කවර හෝ කාර්යයක් සඳහා ණය ලබාදිය හැකි අතර, 2004.12.31 වන විට අනුමත වී ඇති ඉහත සඳහන් කාර්යයන් සඳහා වූ දේපල ණය මුදල් වෙනුවෙන් ප්‍රමුඛත්වය ලබාදිය යුතුය.**

**04.** **ඉහත 11:11:1 වගන්තියේ සඳහන් පරිදි බැංකුව වෙත අදල ණය ඉල්ලුම්පත්‍රය නිර්දේශ කරනු ලබන තම අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා ආයතනවල නිලධාරින්ගේ තනතුරු නාම ලේඛනයක් අදල අමාත්‍යාංශ ලේකම් විසින් 28 පරිශිෂ්ටයේ සඳහන් බැංකුවලට දැනුම් දිය යුතුය.**



**ඩී. දිසානායක**
**ලේකම්,**
**රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ**
**කටයුතු අමාත්‍යාංශය**

k/DG/unit 7/k-loan

**26 පරිශිෂ්ටය**
**ණය ඉල්ලුම් කිරීමේදී ඉදිරිපත් කල යුතු අයදුම් පත්‍රය**
**(11:11:1)**

1. මුලකුරු සමග නම මහතා/මහත්මිය/මෙය :.............................................................
මුලකුරු වලින් කියවෙන නම් : ............................................................................
ස්ථිර ලිපිනය :- ..................................................................................................
විවාහක/අවිවාහක බව : ..............................................
උපන් දිනය හා ස්ථානය:..........................ජාතික හැඳුනුම්පත් අංකය:....................
දුරකථන අංකය (නිවස) : .......................................................................................
රාජකාරි ස්ථානය : ................................................................................................
තනතුර : ........................................ තනතුරේ සේවා කාලය: ..........................
දුරකථන අංකය (රාජකාරි) : ..................................................................................

2. භාර්යාව/ස්වාමිපුරුෂයාගේ සම්පූර්ණ නම: .........................................................
උපන් දිනය සහ ස්ථානය : ........................ ජාතික හැඳුනුම්පත් අංකය: ..............
රාජකාරි ස්ථානය : ...............................................................................................
ලිපිනය : ..............................................................................................................
තනතුර : ............................................... තනතුරේ සේවා කාලය: .......................
දුරකථන අංකය (රාජකාරි) : ..................................................................................
යැපෙන්නන්ගේ සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ වයස්: ...............................................

3. ණය අයදුම් කරන කාර්යය : (11:1 උප වගන්තිය අනුව).........................................
...........................................................................................................................

4. ණය මුදලේ ප්‍රමාණය රු: .......................... ආපසු ගෙවන කාලය: .....................

5. ණය මුදලේ සුරක්ෂිතතාව වෙනුවෙන් ඉදිරිපත් කරන දේපලේ නීතිමය විස්තර
වරිපණම් අංකය........................... භූමියේ ප්‍රමාණය ...................................................
වීදිය හා නගරය : ......................................................................................
අයිතිකරු : ......................................................................................
මිලදී ගත් වටිනාකම : .......................... ඉදිකිරීම් වියදම් රු. .............................
සැලසුම් අංකය : .......... ලොට් අංකය: ........... සැලසුම සකස් කළ දිනය:................
මිනුම්දෝරුතැනගේ නම: ......................................................................................
ඉඩම බැදීමකට යටත් නම් ඒ පිළිබඳ විස්තර...............................................................

6. මාසික ආදායම :
අයදුම්කරුගේ සම්පූර්ණ වැටුප රු:....................................................
කලත්‍රයාගේ සම්පූර්ණ වැටුප රු: .......................................................
වෙනත් ආදායම් (සඳහන් කරන්න) රු: ..........................................

මුළු ආදායම : රු. .......................................

7. බැංකු ගිණුම්:

| **බැංකුවේ නම** | **බැංකු ශාඛාව** | **ගිණුම් අංකය** | **ගිණුමේ වර්ගය** |
|---|---|---|---|
| .............................. | ............................ | ................................ | .............................. |
| .............................. | ............................ | ................................ | .............................. |

8. පවතින බැඳීම් ණයකරුවකු / ඇපකරුවකු ලෙස

| බැංකුව | මුල් ණය මුදල | දැනට පවතින ණය මුදල | ඉදිරිපත් කරන ලද සුරැකුම | ණය ලබාදුන් හේතුව |
|---|---|---|---|---|
| .......................... | රු. ................. | රු. .................. | ................ | ........................ |
| .......................... | රු. ................. | රු. .................. | ................ | ........................ |

9. **29 පරිශිෂ්ටය අනුව ණය අයදුම් කිරීමේදී ඉදිරිපත් කළයුතු ලියකියවිලි (මුල් පිටපත්) මේ සමග ඉදිරිපත් කරමි.**

**මිලදී ගැනීමක් නම්:** විකිණීම පිළිබඳ එකගතාව, මිලට ගන්නා දේපලට අදළ ඔප්පුවේ පිටපත සහ අනුමත ගොඩනැගිල්ලේ සැලැස්ම, විකිණුම්කරු විකිණීමට කැමැත්ත ප්‍රකාශිත ලිපිය ( **30 පරිශිෂ්ටය අනුව**)

10. **අයදුම්කරු පාලනය වන නීතිය:** සාමාන්‍ය නීතිය / උඩරට නීතිය / තේසවලමේ නීතිය / මුස්ලිම් නීතිය

දේපල ණය මුදල් ලබාගැනීමට අදළ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 11 වගන්තියේ විධිවිධානයන්ට හා බැංකුව විසින් අනුගමනය කරනු ලබන නීතිරීතිවලට යටත්ව දේපල ණය මුදල ලබා ගැනීමට එකඟ වෙමි.

..................................................
අයදුම්කරුගේ අත්සන

දිනය:-

---

...................................... (අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ) ආයතන ශාඛාව විසින් සම්පූර්ණ කල යුතුය.

1. මුල් පත්වීමේ දිනය :-

2. උපන් දිනය :- ණය ඉල්ලුම් කරන දිනට වයස:-

3. (අ) විශ්‍රාම වැටුප් සහිත ස්ථිර පත්වීමක් ද?

   (ආ) එසේ නම් කවර දිනක සිට ද?

4. රජයෙන් ලබාගෙන ඇති ගෙවීමට ශේෂ ව තිබෙන ණය පිළිබඳ විස්තර

| ණය වර්ගය | ............. දිනට ගෙවිය යුතු ණය ශේෂය |
|---|---|
| | |

5. මාසික වැටුප් විස්තරය:-
   - I. මාසික ඒකාබද්ධ වැටුප :- ........................................................ XXX
   - II. දීමනා :- ........................................................................ XXX
   - III. මුළු වැටුප :- ................................................................... XXX
   - IV. මුළු අඩුකිරීම් (බැඳීම්ගත අඩුකිරීම් සහිතව):-................................ (XXX)
   - V. ශුද්ධ වැටුප :- .............................................................. XXX
     (අදළ මාසයේ වැටුප් විස්තරය අමුණා ඇත)
   - VI. ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 11:4:1 වගන්තියේ විධිවිධාන අනුව නිලධාරියාට ලබාදිය හැකි උපරිම ණය මුදල දීමනා හැර මාසික ශුද්ධ වැටුපෙන් ණය මුදලේ වාරිකය හා සේවකයාගෙන් අයකරනු ලබන 4% පොලිය යන කොටස් දෙකම අඩුකිරීමට හැකිවන ආකාරයට තීරණය කළයුතුය :-

     (ඉලක්කමෙන් ......................................)
     (අකුරෙන් ............................................)

6. නිලධාරියාට විරුද්ධව නොවිසඳුන විෂමාචාර චෝදනාවක් හෝ දැනට විභාග වෙමින් පවතින විෂමාචාර චෝදනා තිබේ නම් ඒ පිළිබඳ විස්තර:-

දිනය:-

මාණ්ඩලික නිලධාරියා
( ආයතන )

**අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය:**

මගේ අංකය :-
අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව :-

කළමණාකරු:-
........................................... බැංකුව
........................................... ශාඛාව

රජය විසින් ලබාදෙන පොලී සහනාධාර මත ............................................ මහතාට / මහත්මියට / මෙනෙවියට ඔහුගේ/ඇයගේ ඉල්ලීම පරිදි .............................................................. (කාර්යය) සඳහා මාසික වැටුපෙන් අයකර ගත හැකි මුදල අනුව පිරිනැමිය හැකි උපරිම ණය මුදල රු. .............................. බව නිර්දේශ කරමි.

එසේම ඔහුගේ වැටුපෙන් බැංකුවේ නිර්දේශ අනුව බැංකුව විසින් ගණනය කරනු ලබන ණය වාරිකය හා 4% පොලිය ද සහිත නිලධාරියාගෙන් අය කළයුතු මාසික ණය වාරිකය හා එම මාසික ණය වාරිකයට ඇතුළත් වන රජය විසින් දරනු ලබන පොලී ප්‍රමාණය ණය වාරිකය සමඟ 11:7:1 වගන්තිය යටතේ මාසිකව බැංකුව වෙත ප්‍රේෂණය කිරීමට එකඟ වෙමි.

අත්සන :

නම :

තනතුර:

(නිල මුද්‍රාව)

**28 පරිශිෂ්ටය**

**ණය ලබාගත හැකි බැංකු නාම ලේඛනය**
**(11:11:6)**

1. මහජන බැංකුව
2. ලංකා බැංකුව
3. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
4. ජාතික ඉතිරි කිරීමේ බැංකුව
5. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

**29 පරිශිෂ්ටය**
**ණය අයදුම්පත්‍රය සමඟ බැංකුව වෙත ඉදිරිපත් කළයුතු ලියකියවිලි**
**(11:11:1)**

<u>ණය අයදුම්පත සමඟ ඉදිරිපත් කළයුතු ලියකියවිලි</u>

1. ජාතික හැඳුනුම්පත ( මුල් පිටපත හා ජායා පිටපත් 1)
2. අවසාන වැටුප් විස්තරය - (සේවා යෝජක විසින් සහතික කරන ලද අවසාන වැටුප් විස්තරය)
3. අනුමත මිනින්දෝරු සැලැස්ම ( මුල් පිටපත)
4. හිමිකම් ඔප්පු ( මුල් පිටපත)
5. වසර 30 කට අදළ ලුහුඩු සටහන්
   (පත්‍රිරු ඉඩම් රෙජිස්ට්‍රාර්)
6. පළාත් පාලන ආයතනයෙන් ලබාගත යුතු ලියකියවිලි
   දේපල හිමිකම් සහතිකය
   පවරා නොගැනීමේ සහතිකය
   වීථි රේඛා හා ගොඩනැගිලි සහතිතය
   තක්සේරු නිවේදනය හා අවසාන කාර්තුවට වරිපණම් බදු ගෙවූ රිසිට්පත
7. දේපලට පිවිසීමේ මාර්ග සටහන
8. තක්සේරු වාර්තාව හා පිරිවැය ඇස්තමේන්තුව
9. අනුමත ගොඩනැගිලි සැලසුම
10. මිලට ගැනීමක් නම් විකුණුම්කරුගේ ලිපිය ( 30 පරිශිෂ්ටය අනුව) හා විකුණුම්කරුගේ
    ජාතික හැඳුනුම්පත හෝ පිළිගත හැකි නිත්‍යානුකල හැඳුනුම්පතක්
    (උදා: රියැදුරු බලපත්‍රය හෝ කාලය ඉකුත් නොවූ ගමන් බලපත්‍රය)

සංලක්ෂ්‍යය :-

ඉල්ලුම් කරනු ලබන ණය මුදලේ සම්බන්ධතාව අනුව අදාළ වන ලියවිලි පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය.

**30 පරිශිෂ්ටය**
**දේපල හිමිකරු දේපල විකිණීමට එකඟතාව**
**ප්‍රකාශ කලයුතු ආකාරය**
**(11:11:2)**

..............................................
..............................................
..............................................
**දිනය**

................................
...................................... බැංකුව
කොළඹ.

## දේපල විකිණීමට එකඟතාව ප්‍රකාශ කිරීම

ඉහත ලිපිනයේ පදිංචි ........................................................................................ වන මට/අපිට/අයත්
(විකුණුම්කරුගේ සම්පූර්ණ නම)
.......................................මහ නගර සභා/ නගර සභා /ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත විස්තර සඳහන් බිම් කොටස/නිවස සහිත දේපල ............................................................
(ගැණුම්කරුගේ ලිපිනය)
......................... ලිපිනයේ පදිංචි ..............................................................................................
( ගැනුම්කරුගේ සම්පූර්ණ නම )
.............................................................................................................................................
(ජා.හැ.අංකය සහ දිනය) යන අයට විකිණීමට කැමැත්ත ප්‍රකාශ කරමි/කරමු.

1. ඔප්පු අංකය / නඩු තීන්දු අංකය: ...................................................... දිනය:.........................
සහතික කල නොතාරිස් තැනගේ නම: ...................................................................................

2. පිඹුරුපත සැකසූ බලය ලත් මිනින්දෝරු තැනගේ නම: .......................................................
පිඹුරුපත සකස් කර ඇති දිනය: ...........................................................................................
කැබලි අංකය : .................... ප්‍රමාණය අක්කර:...............රූඩ්: ...............පර්: ....................
වරිපණම් අංකය: ........................ පාරේ නම: .....................................................................

3. ඉහත විස්තර සඳහන් දේපල මුදලින් රුපියල්: .....................................................................
(අකුරින් ලියන්න)
(රු. ...................) විකිණීමට එකඟතාව ප්‍රකාශ කරමි.
මෙම දේපල විකිණීම වෙනුවෙන් අත්තිකාරම් මුදල් වශයෙන් රු. .......................ක් දැනටමත් මා විසින් ලබාගෙන ඇති බව පිළිගන්නා අතර ඔබ ආයතනයෙන් අනුමත ණය මුදලත්, විකිණීමට ගිවිසගෙන ඇති ණය මුදලත් අතර වෙනසක් වේ නම් එම මුදල ඔප්පු අත්සන් කරන අවස්ථාවේදී ගැනුම්කරුගෙන් ලබාගැනීමට කැමැත්ත ප්‍රකාශ කරමි. ඔබ ආයතනයෙන් මා වෙත ලැබෙන මුදල් මාගේ පහත සඳහන් බැංකු ගිණුමෙහි බැරට ගෙවන මෙන් ඉල්ලමි/ඉල්ලමු.

4. බැංකු ගිණුමෙහි සඳහන් නම: ......................................................................................
බැංකුව/ශාඛාව : ......................................................................................................
ගිණුම් අංකය : ...............................................................................................
(ඇටර්නි බලකරු සිටින අවස්ථාවලදී ඇටර්නි බලකරුගේ බැංකු ගිණුම් විස්තර නොව විකුණුම්කරුගේ බැංකු ගිණුම් විස්තර ඇතුලත් කල යුතුය)

5. විකුණුම්කරුගේ ආදර්ශ අත්සන සහතික කරන අය පහත සඳහන් කෙනෙකු විය යුතුය.
   1. අදාල කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි
   2. අධිකරණ බල ප්‍රදේශය තුළ නීතිඥයකු
   3. පූජනීය ස්ථානයක ප්‍රධාන පූජකතුමා
   4. සිවිල් ලැයිස්තුවේ නම සඳහන් නිලධාරියකු

01.

02.

................................................
විකුණුම්කරුගේ/කරුවන්ගේ ආදර්ශ අත්සන
ජාතික හැඳුනුම්පත් අංකය සහ දින

01. ................................
02. ................................

**අත්සන සහතික කරන ලද අයගේ,**
නම : ..................................................................................................
තනතුර: ...............................................................................................
ලිපිනය : ...................................................................................................
අත්සන: ....................................................දිනය: ...................................................
ජාතික හැඳුනුම්පත් අංකය: